කොළඹ දිසා අධිකරණයේ දී ය.

හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
හිල්ටන් ස්පෝර්ට්ස් කම්ප්ලෙක්ස්,
ඇව්ලන් චතුරශ්‍රය,
කොළඹ 01.

7 පැමිණිලිකරු.

නඩු අංකය: 15322/එම්.ආර්. - එදිරිව -

නිහාල් ශ්‍රී අමරසේකර,
කොමින්ඩ්ටැක්ස් මැනේජ්මන්ට් සර්විස් ලිමිටඩ්,
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

විත්තිකරු.

1994ක් වූ නොවැම්බර් මස 18 වන මෙදිනදී ය.

ස්වකීය නීතිඥවරුන් වන, ' ද සිල්වා සහ පෙරේරා" යන නාමය හා විලාශය යටතේ නීති වෘත්තියේ නිරත, නීතිඥ ජේ.ඩබ්ලිව්.ඩී. පෙරේරා මහතා සහ ඔහුගේ සහායක නීතිඥ, වර්නන් ගුණරත්න මහතා මගින් පෙනී සිටිනු ලබන ඉහත නම සඳහන් විත්තිකරුගේ උත්තරය, පහත සඳහන් අයුරු ප්‍රකාශ කෙරේ.

1. මෙහි මින් මතු නියත වශයෙන්ම පිළිගනු ලැබ ඇත්තා වූ සහ මෙහි අඩංගු වන සම්ප්‍රකාශයන්ට අනනුකූලතාවයක් නොපාන්නා වූ හෝ වෙනසක් නොපාන්නා වූ සම්ප්‍රකාශයන් මිස සහ හැර, පැමිණිල්ලෙහි අන් සම්ප්‍රකාශයන් සාමූහිකව සහ ඒකීය වශයෙන් විත්තිකරු අපලාපනය කර සිටී.

2. පැමිණිල්ලේ 1 සහ 4 ඡේදයන්හි සම්ප්‍රකාශයන් විත්තිකරු විසින් පිළිගනු ලැබේ.

3. පැමිණිල්ලේ 2 ඡේදයෙහි සම්ප්‍රකාශයන්ට උත්තර දෙමින්, පදිංචි ස්ථානය පමණක් විත්තිකරු විසින් පිළිගනු ලබන නමුත්, එහි අඩංගු සෙසු සම්ප්‍රකාශයන් ඔහු විසින් අපලාපනය කර සිටිනු ලැබේ.

4. පැමිණිල්ලේ 3 ඡේදයට උත්තර දෙමින්, ඔහු 83.03.15 දින සිට, පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරයෙකුව සිටි බව විත්තිකරු පිළිගන්නේ වී නමුත්, එලෙස සිටියේ ඔහු ඉන් ඉවත් කළ දිනයවූ 90.12.22 දින තෙක් පමණක් බව විත්තිකරු කියා සිටී.

5. පැමිණිල්ලේ 5 ඡේදයෙහි සම්ප්‍රකාශයන්ට උත්තර දෙමින් විත්තිකරු කියා සිටිනුයේ :

(අ) ජපානයේම සමාගම් දෙකක්වූ, සී/ස. මිට්සුයි සහ සමාගම සහ තායිසේ කෝපරේෂන් සමාගම සහ ශ්‍රී ලංකා රජයත්, සී/ස. කෝර්නල් සහ සමාගමද එකතුව, ඔවුන් විසින් සහ ඔවුන් අතර එළඹුන, ආයෝජන ගිවිසුම ප්‍රකාර, කොළඹ හිල්ටන් ජාත්‍යන්තර හෝටලය ඉදිකිරීම සහ එහි අංගෝපාංග උපකරණ පරිපූර්ණය කිරීම, ක්‍රියා යෝග්‍ය මළ තියම කළ පදනමක් මත, එකී ජපාන සමාගම් දෙක විසින් කළ යුතුව තිබුන බවත්,

(ආ) ඉහතකී වැඩ පිළිවෙලෙහි කොටසක් සහ එයට අවශ්‍යයෙන් බැඳෙන්නක් ලෙසින්, එම කාර්යය සඳහා ණය මුදල්ද, සී/ස. මිට්සුයි සහ සමාගම සහ තායිසේ කෝපරේෂන් සමාගම විසින් වැඩිදුරටත් පිරිනැමීමට ඉදිරිපත් වන ලදුව, පැමිණිලිකාර සමාගමේ බහුතර කොටස් දරන්නා වශයෙන්, දැනට 64%ක කොටස් ප්‍රමාණයක් උසුලන, ශ්‍රී ලංකා රජය, එම ණය මුදල්වලට ඇපවුන බවත් ය.

84.01.31 දිනැති එම ආයෝජන ගිවිසුමේ සත්‍ය පිටපතක් 'වි1' වශයෙන් සලකුණු කොට මෙයට යාකොට ඇති අතර, එය මෙහිම කොටසක් සහ මෙයට අවශ්‍යයෙන් බැඳෙන්නක් ලෙසට අයැද සිටී.

6. පැමිණිල්ලේ 6 ඡේදයට උත්තර දෙමින්, එහි සඳහන් කර ඇති කොන්දේසිය, වෙනත් ඒවා අතර, ඉටු කිරීම, පැමිණිල්ලෙන් යටපත් කර ඇති සහ එයින් අයැද නොමැති, 'වි1' වශයෙන් සලකුණු කර ඇත්තාවූ, ඉහතකී ආයෝජන ගිවිසුමෙහි 17.01 සහ 17.02 ව්‍යවස්ථාවන්හි නියමයන් අනුව, සී/ස. කෝර්නල් සහ සමාගමේ වගකීම වන බව, විත්තිකරු කියා සිටී.

එකී ආයෝජන ගිවිසුමෙහි 17.01 සහ 17.02 ව්‍යවස්ථාවන් පිළිවෙලින් 'වි1අ' සහ වි1ආ වශයෙන් සලකුණු කොට ඇත.

7. පැමිණිල්ලෙහි 7, 8, 10, 11, 15 සහ 16 ඡේදයන් විත්තිකරු නියත වශයෙන් සහ අවධාරණයෙන්ම අපලාපනය කර සිටී.

8。 (අ) පැමිණිලිකාර සමාගමේ 84.02.27 දිනැති ලිපියටත්, සී/ස. මිට්සුයි සහ සමාගම සහ තායිසේ කෝපරේෂන් සමාගම විසින්, පැමිණිලිකාර සමාගම වෙත අමතන ලද, 84.02.28 දිනැති ටෙලෙක්ස් පණිවුඩය අමුණා තිබූ, 84.02.28 දිනැති පැමිණිලිකාර සමාගමේ ලිපියටත්, විත්තිකරු විසින් අත්සන් කරනු ලැබුවේ, පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් පමණක් වන බවත්, සී/ස. මිට්සුයි සහ සමාගම සහ තායිසේ කෝපරේෂන් සමාගම විසින් කරනු ලැබූ නියත කරුණු ඇක්වීම්වල පදනම මත, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින්, පැමිණිලිකාර සමාගමට පිළිතුරු වශයෙන්, 84.03.01 දිනැති ලිපිය අමතන ලද්දේ, මෙම ඉහතකී ලිපිවලට පිළිතුරු දෙමින් විනා, මුදල් අමාත්‍යංශයේ ලේකම් අමතනු ලැබූ, 'ආ' වශයෙන් සලකුණු කරමින්, පැමිණිල්ලට යාකොට ඇත්තාවූ, පැමිණිලිකාර සමාගමේ 84.02.28 දිනැති ලිපියට නොවන බවත්,

එකී 84.02.27, 84.02.28 සහ 84.03.01 දිනැති ලිපිවල සහ 84.02.28 දිනැති ටෙලෙක්ස් පණිවුඩයේ සත්‍ය පිටපත්, පිළිවෙලින් 'වී2', 'ව2අ', 'ව2ආ' සහ 'ව2ඇ' වශයෙන් සලකුණු කොට මෙයට අමුණා ඇති අතර, ඒවා මෙහිම කොටසක් සහ මෙයට අවශ්‍යයෙන් බැඳෙන්නක් ලෙසින් අයැද සිටී.

(ආ) 84.02.27 දිනැති ('වී2') සහ 84.02.28 ('වී2අ') ලිපි සහ 84.02.28 ('2විආ') ටෙලෙක්ස් පණිවුඩය පැමිණිල්ලෙන් යටපත් කොට එයින් අයැද නොමැති බවත්,

(ඇ) විත්තිකරු ඒ අවස්ථාවේ, උක්ත කාරණයෙහි නියැලුනේ, පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන්, වැදගත් වන්නාවූ සියලු කල්හිම, පැමිණිලිකාර සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂව සිටි, කෝර්නල්. එල්. පෙරේරාගේ නියත ඉල්ලීම පිට වන අතර, එසේ හෙයින්, එම කාර්‍ය්‍ය සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම, එකී කෝර්නල් එල්. පෙරේරා සතුව පැවති යුතුකම සහ වගකීම වූන බවත්,

විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

9。 (අ) ඉහතකී ලිපි සහ සඳහන් කළ පිළිතුර, පැමිණිලිකාර සමාගමේ එවකට අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලීම මත සහ ඔවුන්ගේ අනුමැතිය ඇතිව වූන අතර, එය පදනම් වූයේ, පැමිණිලිකාර සමාගම වෙත සී/ස. මිට්සුයි සහ සමාගම සහ තායිසේ කෝපරේෂන් සමාගම විසින් අමතන ලද, 'ව2ඇ' ලෙස සලකුණු කර ඇති ඉහතකී 84.02.28 දිනැති ටෙලෙක්ස් පණිවුඩයේ

සී/ස. ජීවිසුයි සහ සමාගම සහ තායිටේ කෝපරේෂන් සමාගම ගෙනහැරපා තිබූ ඔවුන්ගේ නියත කරුණු දැක්වීම්, මත වූන බවත්,

(ආ) ඉහත සඳහන් 84.03.01 දිනැති ('2වීආ') ලිපියෙන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දෙනු ලැබූ නියමය, ඉහතකී 84.02.28 දිනැති ටෙලෙක්ස් පණිවුඩය ප්‍රකාර, සී/ස. ජීවිසුයි සහ සමාගම සහ තායටේ කෝපරේෂන් සමාගම කරනු ලැබූ කරුණු දැක්වීමේ පදනම මත වී ඇති අතර, ඉහතකී 84.03.01 දිනැති ලිපියේ පිටපතක් ඔවුන් වෙත සපයා තිබියදීත්, පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරුන්ව සිටියදීත්, වැඩිමනත්වම, වැදගත් වන්නාවූ සියලු කල්හිම, ඔවුන්ගේ නියෝජිතයා මාර්ගයෙන්, පැමිණිලිකාර සමාගමේ විධායක අධ්‍යක්ෂ තනතුර දරමින් සිටියදීත්, 84.03.01 දිනැති එම ලිපියෙන් ඉල්ලුම් කළ, සාක්ෂි සහ තොරතුරු, සැපයීම, සී/ස. ජීවිසුයි සහ සමාගමේ සහ තායිටේ කෝපරේෂන් සමාගමේ වගකීම වූන බවත්,

විත්තිකරු වැඩි දුරටත් උත්තර දෙමින් විත්තිකරු කියා සිටී.

10. විත්තිකරු විසින් කිසිදු හෝ චෝදිත ලේඛනවක් සැපයුයේ නැති බවත්, එගෙන් ඉහතකී ඉල්ලීම ක්‍රියාවේ යොදවමින්, පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන්, එය වෙනුවෙන් ක්‍රියා කරමින්, ඉහතකී පරිදි, සී/ස. ජීවිසුයි සහ සමාගම සහ තායිටේ කෝපරේෂන් සමාගම විසින් ඉහතකී පරිදි ගෙන හැර පෑ කරුණු දැක්වීම් ඉදිරිපත් කරමින්, විත්තිකරු හුදෙක් ලිපි ගනු දෙනු කළ බවත්, පැමිණිලිකාර සමාගමේ සම්ප්‍රකාශයන්, ඉහත සඳහන් පරිදි, ලේඛණ සහ සාධ්‍ය සිද්ධාන්ත යටපත් කොට, පූර්ණ ලෙසින්ම ගොතන ලද්දාවූ, පදනම් විරහිත, අසත්‍ය සහ නොමග යවන සුලු ඒවා බවත්,

වැඩිදුරටත් උත්තර දෙමින්, විත්තිකරු කියා සිටී.

11. චෝදිත වශයෙන් පැමිණිලිකාර සමාගමේ බදු කාරණයන් පිළිබඳව නිරත වූයේ, පැමිණිලිකාර සමාගමේ ගණන් පරීක්ෂකවරුන් වන, වරලත් ගණකාධිකාර ෆෝර්ඩ්, රෝඩ්ස්, තෝර්න්ටන් සහ සමාගම වූන බවත්, විත්තිකරුගේ දැනුමට, විත්තිකරු පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරයෙකුව සිටියදී, කිසි විටෙකවත්, ඔවුන් විසින් මෙම කාරණය කෙරෙහි අවධානය යොමු කලේවත්, 84.03.31, 85.03.31, 86.03.31, 86.03.31, 87.03.31, 88.03.31, 89.03.31 හා 90.03.31 දිනයන්ගෙන් අවසන් මුදල් වර්ෂ සඳහාවූ, ඔවුන් විසින් සහතික කලාවූ, පැමිණිලිකාර සමාගමේ විගණනය කළ වාර්ෂික ගිණුම්හී, කිසිදු විටෙකවත්, ඒ ගැන රපෝර්තු කලේවත් නැති බවත්, තවදුරටත් උත්තර දෙමින් විත්තිකරු කියා සිටී.

(.....5

12. පැමිණිල්ලේ 12, 13 සහ 14 ඡේදයන්ට උත්තර දෙමින්, එහි අඩංගු සම්ප්‍රකාශයන් ඔහු නොදත් බව විත්තිකරු කියා සිටින අතර, එහි සඳහන් කාරණාවන්, මෙහි ඉහත 6 ඡේදයෙහි ගෙනහැර දක්වා ඇති ප්‍රකාර, සී/ස කෝරල් සහ සමාගමේ සහ ඉහත සඳහන් පරිද්දෙන් පැමිණිලිකාර සමාගමේ **ගණන් පරීක්ෂකවරුන්ගේ බැඳියාව හා එකඟත්ව වූන** අතර, ඔවුන් පිළිවෙලින්, ව්‍යවස්ථාපිතව සහ වෘත්තීය වශයෙන් එකඟව යුතු බවට, විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

13. පැමිණිල්ලේ 9 ඡේදයට උත්තර දෙමින් විත්තිකරු කියා සිටින්නේ, අධ්‍යක්ෂවරයෙකු වශයෙන් විශ්වසනීය යුතුකම් සහ බැඳීම් ඉටු කරමින් පැමිණිලිකාර සමාගමේ යහපත තකා ක්‍රියා කල එහි එකම අධ්‍යක්ෂවරයා ඔහු පමණක් වූන අතර, අනෙකුත් අධ්‍යක්ෂවරුන් හිතාමතාම ක්‍රියා කිරීමට අසමත්ව පැහැර හරින ලද්දෙන්, වෙනත් දේ අතර:

- මූලික ගෘහ නිර්මාන සැලසුම් විනාශ වීම සහ/හෝ යටපත් කිරීම,
- සියළුම කොන්ත්‍රාත්තුගත ගිවිසුම් සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් පනවනු ලැබ ඇත්තා වූ ක්‍රියා පරිපාටිය පැහැදිලිව ම උල්ලංඝනය කරමින්, ඉදිකිරීම් ආරම්භව දෙවසරක් ඉක්මවීමෙන් අනතුරුව, "සංශෝධිත සැලසුම්" යනුවෙන් විස්තර කෙරුනු, නව ගෘහ නිර්මාන සැලසුම් කපට ලෙසින් සහ නීතිවිරෝධීව, ආදේශ කිරීම.
- සැපයුම්හි කොන්ත්‍රාත්තු ගත ද්‍රව්‍ය ලැයිස්තුව විනාශ වීම සහ/හෝ යටපත් කිරීම,
- ස්වාධීන වෘත්තීය වගවිභාගයකට සහ සත්‍යායනය කිරීමකට විරෝධය පාමින්, මුදල් ලබා ගැනීමට උත්සාහ දැරීම.
- එයද, සහතික කිරීම් තහවුරු කරනු පිණිස නියමිත පරිමාණ බිල්පත්, අවසන් බිල්පත් සහ ස්ථිර වත්කම්හි දේපල ලැයිස්තුවක් රහිතව, වැඩ සම්පූර්ණ කිරීමේ සහ අවසන් කිරීමේ සහතික වශයෙන්, 3වැනි විත්තිකරු විසින් දෙනු ලැබූ සාමාන්‍ය "වෛද්‍ය සහතික" පත්‍රයේ ලිපිවල පදනම මත වීම.

- එහි ප්‍රතිඵලයක් වශයෙන් මූලික ගෘහ නිර්මාණ සැලසුම් සහ 1වැනි සහ 2වැනි විත්තිකරුවන් විසින් එ ඉදිරිපත් කරනු ලැබූ ලාභ උපදන සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපනයන් හා සමග සැසඳූ කල්හි සැබැවින්ම ඉදි කළ හෝටලයේ බරපතල ඌනතාවයන් තිබීමද,

ඇතුලත්ව , පැවති වංචනික තත්ත්වය සහ පැමිණිලිකාර සමාගමේ එකී අධ්‍යක්ෂවරුන්ගේ වරදකාර පාලනය අරභයා, ඉහත කී සී/ස මිට්සුයි සහ සමාගමට සහ ජපාන ගෘහ නිර්මාණ ශිල්පීන් වන තායිසෙයි කෝපරේෂන් සමාගමට සහ නඩුවේ නම් කරනු ලැබූ, එවකට පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරුන්ට එරෙහිව පැමිණිලිකාර සමාගමේ යහපත සහ එහි ඵල ප්‍රයෝජනය සඳහාත්, එහි අයිතිය මත සහ එය වෙනුවෙන්, නීතියෙන් ව්‍යුත්පන්න නඩුවක් ලෙස, විත්තිකරු විසින් 90.09.13 වන දින මෙම අධිකරණයේ අංක 3155/විශේෂ දරන නඩුව පවරන ලද බවත්ය.

14. (අ) ඉහත සඳහන් කො ළඹ දි.උ. අංක 3155/විශේෂ දරන නඩුවේ මෙම අධිකරණය විසින් 90 සැප්තැම්බර් මසදී වාරණ නියෝගයන් නිකුත් කරනු ලැබ, විමසීමකින් අනතුරුව, 1991 ඔක්තෝම්බර් මස දී අතුරු ඉන්ජන්ෂන් තහනම් නිකුත් කරන ලද අතර, එම අතුරු ඉන්ජන්ෂන් තහනම් 92 දෙසැම්බර් මස දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තහවුරු කරනු ලැබ ඇති බව විත්තිකරු වැඩිදුරටත්, කියා සිටී.

(ආ) අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝග නිකුත් කිරීමේ දී ප්‍රකාශයට පත් කරනු ලැබූ නියෝගයේ, උගත් දිසා විනිසුරු තුමා වෙනත් දේ අතර, මෙසේ නිරීක්ෂණය කර ඇත:

- 1වැනි සහ 2වැනි විත්තිකරුවන් වෙත ගෙවීම් කිරීම සඳහා පිළිගත හැකි පදනමක් දැනට නැත.

- අධ්‍යක්ෂවරුන් වන අනෙකුත් විත්තිකරුවන්, සමාගමට සම්බන්ධකම් සහ සමාගම පිළිබඳව උනන්දුවක් දක්වන පුද්ගලයින් වශයෙන් මුදල් ගෙවීමට ක්‍රියා කරයින්, නිවැරදි පරීක්ෂණයක් පැවැත්වීමට සූදානම් වී නැත.

- එකී පුද්ගලයින් එවැනි නිවැරදි පරීක්ෂණයක් පැවැත්වීම වළක්වන ලෙසුව, කොයි කවර හැටියකින් නමුත්, මුදල් ගෙවීම ඉක්මන් කර දීමට ප්‍රයත්න දරති.

- කොන්ත්‍රාත් ගිවිසුම්වලට සහ විස්තර ප්‍රකාශ පත්‍රය හා සම්බන්ධ වැඩ සම්බන්ධ නාරණයන් පිලිබඳව ප්‍රශ්න නැගීම වලක්වාලීමට, මෙම පුද්ගලයින් සමාජයෙන් ලද බලය යොදවන්නේ ද යන වග.

- එකී පුද්ගලයින්ගේ සහයෝගතාවය, සමාගමේ කොටස්කරුවන්ගේ අයිතීන්ට පටහැනි වන බව හා එවැනි සහයෝගිත්වයකින් ක්‍රියා කිරීම කොටස්කරුනස්ගේ අවිතීන් පරාජය කිරීමට ඉඩ දෙන ආකාරයකින් වන බව.

- මෙය පහදා දීමේ තත්ත්වය නිවැරදි නම්, මෙය සැබැවින්ම එකත සහයෝගයකින් ක්‍රියා කරනු ලබන සිද්ධියකි.

එකී දිසා අධිකරණ නියෝගයේ සත්‍ය පිටපතක් 'වී3' වශයෙන් සලකුණු කොට මෙයට යාකොට ඇති අතර එය මෙහිම කොටසක් සහ මෙයට අවශ්‍ය යෙන් බැඳෙන්නක් ලෙසින් අයැද සිටී.

15. ඉහත කී කොළඹ දි.උ. අංක 3155/විශේෂ දරණ, ව්‍යුත්පන්න නඩුව පැවරීමෙන් අනතුරුව සහ වාරණ නියෝගයන් නිකුත් කිරීමෙන් පසුව, පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් විත්තිකරු 90.12.22 වන දින . ඉවත් කරන ලද බව විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

16. කොළඹ දි.උ. අංක 3155/විශේෂ දරණ නඩුවේ, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉහත සඳහන් අතුරු ඉන්ජන්ෂන් තහනම් නිකුතුව පිළි ගනිමින් 92 දෙසැම්බර් මස දී දෙන ලද සුවිශේෂ නඩු තීන්දුවක, වෙනත් දේ අතර, පහත සඳහන් පරිදි නිගමනය කල බව විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

- නිත්‍යානුකූලව බලාත්මක කළ හැකි වන්නා වූ අයිතියක් තමා සතු බවටත්, බරපතල ප්‍රශ්නයක් හා හුදු බැලීමටම පෙනී යන වංචනික නඩුවක් සහ වරදකාර පාලනයක් ද ඇති බවත්, ඉල්ලා ඇති සහනයන්ට සමාගමට හිමිකම් ඇති බවටත්, ස්ථාපිත කිරීමට පැමිණිලිකරු සමත් වී ඇති බව.

( ඉල්ලා ඇති සහනයන් වනුයේ 1වැනි සහ 2වැනි විත්තිකරුවන්ට සහ 3වැනි විත්තිකරුට ඔවුන යම් ගෝ ආකාරයකින් ගෙවීමකට හිමිකම් නොමැති බවය.)

......./ 8

- විත්තිකරුවන්ගේ උත්තරවාද, විරෝධතා, සැල කිරීම්වල සඳහා ඇති හේතු දැක්වීම් අඩියස වුව ද, විත්තිකරුට, එහි පැමිණිලිකරු වශයෙන් සමත්වීමේ සෑහෙන තරම් සහ නියත හැකියාවක් ඇති බව.

- මෙහි විත්තිකරුවන, එහි පැමිණිලිකරුගේ සමත්වීමේ අවකාශය නියතයක් වනු විනා, කල්පනා මාත්‍රිකයක් නොවන බව හුදෙක් වාද කල හැකි නඩුවකට වඩා නඩුවක් ඔහුට ඇති බව.

- නඩුවේ උද්ගත හේතු සාධක අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ රජයේ නියෝජිතයින් ද ඇතුලුව අධ්‍යක්ෂවරුන් විසින් සහයෝගය දීමක් නො කරන අතර ඔවුන්ට මැදිහත් වීමට නොහැකිව අසරණ වී ඇති බව.

- ප්‍රධානතම කොටස්කරුවකු වීමෙන්, රජයට උදාසීන වමට මෙය කාරණයක් නොවන බව පෙන්වා දිය හැකිය. රජය විසින් ඇප සහතික පත් නිකුත් කිරම මඟින් සමාගම විසින් ණයට ගත් මුදල් ආපසු ගෙවීමට රජය වගකීම පවරා ගෙන ඇත.

- අතුරු ඉන්ජන්ෂන් තහනම් ප්‍රදානය කරනු ලැබුවේ රටෙන් සහ සමාගමෙන් "මුදල් ඈඩ ලෙස පිටතට ඇදී යාම" වලක්වාලීමට බව.

- අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගය නොවන්නට ඇපුලියාවේ ඇස්කපුලම් සංග්‍රාමයෙන් පසු, පිරිගස් මෙන්, මෙවැනි තවත් එක් ජවග්‍රහණයක් ලදහොත්, අප පරාදයි, යනුවෙන් පැවසීමට සමාගමට ඒකාන්තයෙන්ම සිදු වනු ඇති බව.

පොදු රාජ්‍ය මණ්ඩලීය 1992 නීති වාර්තා වන්හි ප්‍රසිද්ධ කරනු ලැබූ එකී ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ සත්‍ය පිටපතක් 'වි4' වශයෙන් ලකුණු කොට මෙයට අමුණා ඇති අතර එහි මෙහිම කොටසක් සහ මෙයට අවශ්‍යයෙන් බැඳෙන්නක් ලෙස ද අයැද සිටී.

17. පැමිණිලිකාර සමාගම හෝ එහි සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කොර්නල් එල්. පෙරේරා ද ඇතුලුව, එහි වවතට වූ කිසිදු හෝ අධ්‍යක්ෂවරයෙකු පැමිණිලිකාර සමාගමට එරෙහිව ගෙතනි කොළඹ දිං.උ. අංක 3155/විශේෂ දරණ නඩුවේ, නිකුත් කරනු ලැබූ අතුරු ඉන්ජන්ෂන් තහනම පිලිබඳව නො තිබියට විරෝධතාවයක් ගොනු කලේවත්, හැකිනම් එසේ කරන ලෙසට විත්තිකරු විසින් අභියෝග කර සිටියද, පැමිණිලිකාර සමාගමේ

සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කෝනල් වී. පෙරේරා ද ඇතුළුව එවකට සිටි එහි අධ්‍යක්ෂවරුන්ගෙන් කිසිවෙකු හෝ උත්තර ඉදිරිපත් කලේවත් නැති බව විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

18. පැමිණිලිකාර සමාගම විසින් ඉහත කී කොළඹ දි.උ. අංක 3155/විශේෂ දරන නඩුවට ගොනු කළ සිය උත්තරයේ ආයාචනයක් වෙනුවට, මෙසේ ප්‍රකාශ කර සිටියේය.

> "තවද, පැමිණිලිකරු විසින් කර ඇති සම්ප්‍රකාශයන් අනුව ඔහුට වාසිදායක තීන්දුවක් ලැබීමට හිමිකමක් ඇති බවට අධිකරණය තීරණය කලහොත් මෙම විත්තිකරු අවශ්‍ය කරුණක් වශයෙන්, අවස්ථානුකූලව විත්තිකරුගේ සහ ඔහුගේ කොටස්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට වහාම පියවර ගන්නා බව ප්‍රකාශ කරයි"

91.04.11 දිනැති එකී උත්තරයේ සත්‍ය පිටපතක් 'වි5' වශයෙන් සලකුණු කොට මෙයට යාකොට ඇති අතර, එය මෙහිම කොටසක් සහ මෙයට අවශ්‍යයෙන් බැඳෙන්නක් ලෙස අයැද සිටී.

19. මෙම අධිකරණයේ පවරනු ලැබූ ඉහත සඳහන් අංක 3155/විශේෂ දරන නඩුව සහ 91 සැප්තැම්බර් මස දී එහි වාරණ නියෝග නිකුතුව ද නොතකමින්, විත්තිකරු එයට දැක්වූ විරෝධතාවයන් ද නොතකා, පැමිණිලිකාර සමාගම එහි අධ්‍යක්ෂවරුන් මගින් සිය ගණන් පරීක්ෂකවරුන් හා ක්‍රියා කරමින් ඉන් අනතුරුව 91 නොවැම්බර් මස දී 90.03.31 දිනෙන් අවසන් මුදල් වර්ෂය සඳහා වාර්ෂික ගිණුම් කට්ටලයක් සහතික කරන ලදුව, 91.01.11 දින පවරනු ලැබූ අංක 3231/විශේෂ දරන නඩුවක් මගින් විත්තිකරු විසින් එකී වාර්ෂික ගිණුම් වාරණය කරවනු ලැබූ බව විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

20. හෝටලය ඉදි කිරීම සහ ස්ථිර වත්කම්හි දේපල ලැයිස්තුව පිළිබඳව ස්වාධීන භෞතික පරීක්ෂණයක්, වග විභාගයක් සහ සත්‍යායනයක් කිරීම සඳහා මෙම අධිකරණයේ අධිකාර පත්‍රයක් නිකුත් කිරීමට පැමිණිලිකරු විසින් කරනු ලැබූ 92.03.03 දිනැති ඉල්ලීමට, සී/ස. මිට්සුයි සහ සමාගම, තායිසේ කෝපරේෂන් සමාගම සහ ජපාන ගෘහ නිර්මාණ ශිල්පීහු ද, විරුද්ධ වෙමින්, එමගින් හෝටලය ඉදි කිරීමේ සහ එහි ස්ථිර වත්කම්හි දේපල ලැයිස්තුවේ නිවැරදිතාවය තමන් විසින්ම සත්‍යායනය කරවා ගැනීමට, පැමිණිලිකාර සමාගමට, එහි අයිතිකරු වශයෙන් සතු නීත්‍යානුකූල අයිතිය වලක්වාලන ලද බව විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

21. (අ) මෙම අධිකරණයේ ඉහත සඳහන් අංක 3155/විශේෂ දරන නඩුවේ පැමිණිලිකාර සමාගම විසින් භාර කරවන ලද 92.03.06 දිනැති විචාරණයන්ට නිසි සහ පූර්ණ ලෙස පිළිතුරු දීමට පැමිණිලිකාර සමාගම හිතා මතාම මඟ හැර ඇති බවත්,

(ආ) එම විචාරණයන් අතරට, ශ්‍රී ලංකා රජයෙන් අදාල කාලයන්හි විශේෂ වරප්‍රසාද සහ උපකාර ලබා ගනු පිණිස ''ස්ප්‍රී'' සහ සමාගම විසින් ජපාන යෙන් මිලියන 340.0 (ශ්‍රී ලංකා රුපියල් මිලියන 170.0)ක මුදලක් හොංකොංහි නියත බැංකු ගිණුමකට ගෙවීම සම්බන්ධ යෙන් ප්‍රශ්නයක් ද මතු කර ඇත. වෙනත් දේ අතර එම වරප්‍රසාදයන්ට:

- රජයේ ඇප සහතික පත් නිකුතුව
- නීතිපතිතුමාගේ මත ප්‍රකාශය
- ආනයන බදු සහනය
- ආදායම් බදු සහනය
- ශ්‍රී ලංකා රජයෙන් වෙනත් කිසිදු අනුමැතියක් සහ එකඟත්වයන්

ඇතුලත් වුන බවත්

විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

22. පහත සඳහන්, කො ළඹ දි.උ. අංක 3155/විශේෂ දරන නඩුව හා සම්බන්ධව, ශ්‍රේෂ්ඨාධිකරණ අංක33/92 සහ 34/92 දරන අභියාචනාවන්හි ඉදිරිපත් කරනු ලැබූ ලිඛිත දේශණවල , පැමිණිලිකාර සමාගමේ පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගේ වරද වරද කිරීමේ ක්‍රියා කලාපයන් සහ කල් ක්‍රියාවන් පැහැදිලිව ම ගෙන හැර දක්වා ඇති බව විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

I. ඒ.තකා , විධායක අධ්‍යක්ෂ

II. එච්. ඔිගාමී, විධායක අධ්‍යක්ෂ

III. කෝර්නල් එල්. පෙරේරා, සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ.

IV. ජේ.එන්. වො ස්සි, අධ්‍යක්ෂ.

92.07.06 දිනැති එකී ලිඛිත දේශණවල සහ පිටපතක් 'වී7' වශයෙනුත්, ඉහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන්ගේ වරද කිරීමේ ක්‍රියා කලාපයන් සහ කල් ක්‍රියාවන් ගෙනහැර දක්වා ඇති අදාල , අංක 36 සිට 44 දක්වා වන පිටු පිළිවෙලින්," වී7අ සිට වී7ච" වශයෙන්

...11

වශයෙන් සලකුණු කොට මෙයට යාකොට ඇති අතර, එය මෙහිම කොටසක් ලෙස සහ අවශ්‍යයෙන්ම බැඳෙන්නක් ලෙසින් අයැද සිටී.

23. (අ) සී/ස මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගමේ ඉල්ලීම පිට ගරු නීතිපතිතුමා මඟින් ක්‍රියා කරමින්, ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 240කට එනම් ශ්‍රී ලංකා රුපියල් මිලියන 12,000කට ආසන්න වටිනාකමකින් යුතු ඉහත කී රජයේ ඇප සහතික පත් සී/ස මිට්සුයි සහ සමාගමට සහ තායිසේ කෝපරේෂන් සමාගමට නිකුත් කළ ශ්‍රී ලංකා රජය, නිකුත් කල එම රජයේ ඇප සහතික පත්වල සම්බන්ධතාවය අරභයා, පැමිණිලිකාර සමාගමෙන්, එහි කොටස්කරුවන්ගෙන්ද, ශ්‍රී ලංකා රජයේ සහ මහජනයාගෙන් අයිතීන් ආරක්ෂා කිරීම සඳහා ඉහත සඳහන් පරිදි, විත්තිකරු විසින් පවුණන ලද ඉහත කී අංක 3155/විශේෂ සහ 3231/විශේෂ දරන නඩු පිළිබඳව සමථයකට එළඹීමට පෑදිගත් වූ බවත්,

එකී රජයේ ඇප සහතික පත්වල සත්‍ය පිටපත් 'පි8 සහ පි8අ' වශයෙන් සලකුණු කොට මෙයට යා කොට ඇති අතර, ඒවා මෙහිම කොටසක් සහ මෙයට අවශ්‍යයෙන් බැඳෙන්නක් ලෙසින් අයැද සිටී.

(ආ) ගරු නීතිපතිතුමා විසින් දෙන ලද උපදෙස් අනුව අතිගරු ජනාධිපති ඩී.බී. විජයතුංග මැතිතුමා විසින් දෙනු ලැබූ නියමයන් ප්‍රකාරව වූ, එම සමථයෙහි නියමයන් සහ කොන්දේසි ගෙනහැර දක්වමින්, 94.06.05 වන දින "සන්ඩේ අයිලන්ඩ්" පුවත්පතේ මුල් පිටුවේ ප්‍රධාන ප්‍රවෘත්ති වාර්තාවක් ලෙස පළ වූ පුවත්පත් වාර්තාවේ සත්‍ය පිටපතක් 'පි9' වශයෙන් සලකුණු කොට මෙයට යාකොට ඇති අතර එය මෙහිම කොටසක් සහ මෙයට අවශ්‍යයෙන් බැඳෙන්නක් ලෙසින් අයැද සිටී.

(ඇ) 94.08.04 වෙනි දින පවුණුවනු ලැබූ මෙම නඩුවේ පැමිණිලිකාර සමාගමේ පෙරකලාසිය අත්සන් කර ඇති පැමිණිලිකාර සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ, කෝනීලියස් එල්. පෙරේරාගේ ඉවත් කිරීමද, වෙනත් දේ අතර, එකී සමථ කොන්දේසිවලට ඇතුලත් විය.

24. (අ) ඉහත සඳහන් පරිදි, පැමිණිලිකාර සමාගමේ අයිතීන් මත සහ එය වෙනුවෙන් එකී අයිතීන් ආරක්ෂා කරනු පිණිස, විත්තිකරු විසින් ඉහත සඳහන් කොළඹ දි.උ. අංක 3155/විශේෂ සහ 3231/විශේෂ දරන නඩු පැවරීමේ පසුතලය මත, පැමිණිලිකාර සමාගමේ සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් එල්.පෙරේරා විසින් එම නඩුව ද්වේශයෙන් යුතුව සහ ද්වේශ සහගත අභිලාශයකින් මෙම පදනම් විරහිත සහ ගොතන ලද නඩුව හිතාමතාම පවරා ඇති බවත්,

(ආ) ඉහත සඳහන් අංක 3155/විශේෂ දරන නඩුවේ වරදකාර අධ්‍යක්ෂ/විත්තිකරුවකු වශයෙන් පැමිණිලිකාර සමාගමේ වර්තමාන සභාපති, අධ්‍යක්ෂ කෝර්නල් එල්. පෙරේරා නම් කරනු ලැබ ඇති අතර, ඔහුගේ වරදකාර කල්ක්‍රියාවන් සහ ක්‍රියා කලාපයන්, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති, ඉහතකී ලිඛිත දේශනවල, පිළිවෙලින්, 'වී7ඇ', 'වී7ඈ' සහ වී7ඉ' වශයෙන් ලකුණු කරනු ලැබ ඇත්තාවූ, අංක 39, 40 සහ 41 දරණ පිටුවල ගෙන හැර දක්වා ඇති බවත්,

(ඇ) ඉහත සඳහන් කොළඹ දි.උ. අංක 3155/විශේෂ සහ 3231/විශේෂ දරන නඩුවල අනාවරණය කර ඇති පරිදි, පැමිණිලිකාර සමාගමේ වැඩ කටයුතු පිළිබඳවත් ඉහතකී ක්‍රියා කලාපයන් සහ කල්ක්‍රියාවන් පිළිබඳවත් වගකීම පූර්ණ ලෙසින් අදාල සියලු කල්හිම පැමිණිලිකාර සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් කෝර්නල් එල්. පෙරේරා වෙත පැවරිය යුතු බවත්

විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

25. වෙනත් දේ අතර, විත්තිකරුගේ නාමයට සහ කීර්තියට හානියක් කිරීමට මෙය ද්වේශසහගත ප්‍රයත්නයක් වශයෙන් ගැරුනු විට, මෙම නඩුව වැරදි හැඟීමෙන් යුතුව පවරන ලද්දක් සහ නීතියෙන් තහවුරු කළ හෝ බලාත්මක කළ හැක්කක් නොවන බවත් විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

<u>පළමුවැනි හරස් ඉල්ලීමක් සඳහා</u>

26. මෙහි ඉහත සඳහන් 1 සිට 25 දක්වා වන ඡේදයන්හි සවිප්‍රකාශයන් විත්තිකරු නැවතත් ප්‍රකාශ කර සිටී.

27. (අ) පැමිණිලිකාර සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කෝර්නල් එල්. පෙරේරා පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට එළිදරව් නොකළ සහ

එහි අනුමැතිය නොලැබ, ඔහුගේම උනන්දුවක් තිබූ තැසිනෝ ව්‍යාපාර ගිවිසුමකට, පැමිණිලිකාර සමාගම ඇතට නෙදර්ලන්තයේ පදිංචි ජොහැනස් බෝවන්ස් නැමැත්තෙකු හා සමග ඇතුළත් වීමට සළස්වන ලද බවත්,

(ආ) එකී ජොහැනස් බෝවන්ස් පැමිණිලිකාර සමාගම වෙත මුදල් ගෙවීම් කළ නමුත් එකී කෝනීලියස් පෙරේරා විසින් එය පරිහරණය කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එකී ජොහැන්නස් බෝවන්ස් හා හටගත් ආරාවුලකින්, ශ්‍රී ලංකා රුපියල් මිලියන 25ක් සහ එක්සත් ජනපද ඩොලර් මිලියන අටකට රාශිකෘත ඉල්ලීමක් පැමිණිලිකාර සමාගමට එරෙහිව එකී ජොහැන්නස් බෝවන්ස් විසින් පිළිවෙලින් කොළඹ දි.අ. අංක 10949/එම්.ආර්. සහ 12978/එම්.ආර්. දරන නඩු මගින් කරනු ලැබ ඇති බවත්

විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

28. (අ) පැමිණිලිකාර සමාගමේ සහ එහි කොටස්කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කරනු පිණිස, ඉහත සඳහන් 18 ඡේදයෙහි දැක්වෙන කොළඹ දි.උ. අංක 3155/විශේෂ දරන නඩුවේ ගොනු කල උත්තරය ප්‍රකාර, ක්‍රියාමාර්ගයක් ගැනීමට වරදකාර අධ්‍යක්ෂවරුන්ගේ අණසක යටතේ ක්‍රියා කරමින් පැමිණිලිකාර සමාගම හිතාමතාම අසමත් වී පැහැර හැර ඇති බවත්,

(ආ) ඉහත කී කොළඹ දි.උ. අංක 3155/විශේෂ සහ 3231/විශේෂ දරන නඩුවල එළිදරව් වී ඇති නොයෙකුත් අයථා ක්‍රියාවන් පිළිබඳව නිසි විගණනය සහ විමර්ශණ පැවැත්වීමට සහ වරදකාර අධ්‍යක්ෂවරුන් සහ අදාළ අනෙකුත් පුද්ගලයන්ට එරෙහිව කිසිදු හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට, වරදකාර අධ්‍යක්ෂවරුන්ගේ අණසක යටතේ පැමිණිලිකාර සමාගම වැඩිදුරටත් හිතාමතාම අසමත්ව පැහැර හරින ලද බවත්,

විත්තිකරු වැඩිදුරටත් කියා සිටී.

29. ඉහත පූර්වාවයවයෙහි,

(අ) පැමිණිලිකාර සමාගමේ අයිතීන් සහ එහි කොටස්කරුවන්ගේ ද අයිතීන් ආරක්ෂා කර ගනු පිණිස කොළඹ දි.උ. අංක 3155/විශේෂ සහ 3231/විශේෂ නඩුවලින් එළිදරව් වූ ඉහත කී අයථා ක්‍රියාවන් පිළිබඳව

වහාම වගවිභාග සහ විමර්ශණ පැවැත්වීමට පැමිණිලිකාර සමාගම නීතියෙන් බැඳී සිටින බවට ප්‍රකාශයක් ලබා ගැනීමටත්,

(ආ) ඉහත (අ) යටතේ පවත්වනු ලබන වගවිභාග සහ විමර්ශණවල ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකාර සමාගමේ වරදකාර අධ්‍යක්ෂවරුන්ට සහ අනෙකුත් අයවලුන්ට එරෙහිව, නීත්‍යානුකූලව අවශ්‍ය කෙරෙන පරිදි වහාම පියවර ගැනීමට පැමිණිලිකාර සමාගමට නියම කරමින් නියෝගයක් ලබා ගැනීමටත්,

(ඇ) ඉහත කී කොළඹ දි.උ. 3155/විශේෂ සහ 3231/විශේෂ දරන නඩුවලින් හෙළිදරව් වී ඇති පරිදි, පැමිණිලිකාර සමාගමේ කටයුතු තත්ත්වය පිළිබඳව එහි සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කොර්නල් එල්. පෙරේරා ප්‍රධාන විධායක වශයෙන් වගකිවයුතු බවට සහ වගකියන ලෙසට සහ ඒ අනුව, ඔහු පැමිණිලිකාර සමාගමේ එවැනි සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ තනතුර හෝ අධ්‍යක්ෂ තනතුරක් හෝ දරන්නට සුදුසු සහ නිසි පුද්ගලයෙකු නොවන බවටත් ප්‍රකාශයක් ලබා ගැනීමටත්,

හරස් ඉල්ලීමක් වශයෙන් පැමිණිලිකාර සමාගමට එරෙහිව නඩු නිමිත්තක් විත්තිකරුට උපචයවී තිබේ.

<u>දෙවන හරස් ඉල්ලීමක් සඳහා</u>

30. මෙහි ඉහත 1 සිට 25 දක්වා ඡේදයන්, වැඩිමනත් ලෙස 6, 11 සහ 12 ඡේදයන් නැවත ප්‍රකාශ කරමින් පැමිණිල්ලෙහි පැමිණිලි කර ඇති කාරණාවන් පිළිබඳව නඩු පැවරිය යුතු නිසි පුද්ගලයන් වනුයේ සී/ස කොර්නල් සහ සමාගම සහ වරලත් ගණකාධිකාර ජෝඩ් රෝඩ්ස් තොන්ටන් සහ සමාගම එරෙහිව මිස ඉහත සඳහන් පරිදි විත්තිකරුට එරෙහිව නොවන බව විත්තිකරු කියා සිටී.

31. ඉහත පූර්වාවයවයෙන්,

(අ) මෙම නඩුවෙන් විත්තිකරුට එරෙහිව සාවද්‍ය ලෙස කර ඇති ඉල්ලීම පිළිබඳව සී/ස කොර්නල් සහ සමාගමට එරෙහිව වහාම නඩු පැවරීමට පැමිණිලිකාර සමාගම නීතියෙන් බැඳී සිටින බවට ප්‍රකාශයක් ලබා ගැනීමටත්,

(ආ) මෙම නඩුවෙන් විත්තිකරුට එරෙහිව සාවද්‍ය ලෙස කර ඇති ඉල්ලීම පිළිබඳව වරලත් ගණකාධිකාර ජෝඩ් රෝඩ්ස් තොන්ටන් සහ සමාගමට එරෙහිව වහාම නඩු පැවරීමට පැමිණිලිකාර සමාගම නීතියෙන් බැඳී සිටින බවට ප්‍රකාශයක් ලබා ගැනීමටත්,

හරස් ඉල්ලීමක් වශයෙන් පැමිණිලිකාර සමාගමට එරෙහිව නඩු නිමිත්තක් විත්තිකරුට උපචය වී තිබේ.

<u>තුන් වන හරස් ඉල්ලීමක් සඳහා:</u>

(32) මෙහි ඉහත 1 සිට 25 දක්වා වන ඡේදයන්හි සම්ප්‍රකාශයන් විත්තිකරු නැවත ප්‍රකාශ කර සිටී.

(33) (අ) විත්තිකරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සම්මාන සාමාජිකයෙකු සහ එක්සත් රාජධානියේ වරලත් කළමණාකරන ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේද, සම්මාන සාමාජිකයෙකු වන බවත්,

(ආ) විත්තිකරු නාමයක් සහ කීර්තියක් ස්ථාපිත කරනු ලැබ, ලෝක බැංකුවේ සහ එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඒජන්සියෙන් අරමුදල් යොදවනු ලබන, රාජ්‍ය අංශ ප්‍රතිසංස්කරණ සහ පෞද්ගලීකරණය වැඩ සටහන් සටහන් සඳහා ජ්‍යෙෂ්ඨ උපදේශකවරයෙකු වශයෙන් ද ක්‍රියා කිරීම ඇතුලුව පුළුල් සේවා ආයත ක්ෂේත්‍රයකට සේවාවන් සලසනු ලබන බවත්,

(ඇ) මුදල්, ක්‍රම සම්පාදන, ජනවාර්ගික කටයුතු කටයුතු සහ ජාතික ඒකාග්‍රතා අමාත්‍යාංශයේ ලේකම් විසින් විත්තිකරු මෑතක දී මුදල් අමාත්‍යාංශයේ උපදේශක වශයෙන් සහ පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද පත් කල බවත්,

(ඈ) රජයේ ඇප සහතික පත්වල සම්බන්ධතාවය අරභයා පැමිණිලිකාර සමාගමේ සහ ශ්‍රී ලංකා රජයේත් මහජනයාගෙත් යහපත තකා විත්තිකරු විසින් පවරනු ලැබූ ඉහත සඳහන් කොළඹ දි.උ. අංක 3155/විශේෂ සහ 3231/විශේෂ දරන නඩු කරනකොටගෙන විත්තිකරුව එකී නඩුවල සමථ කොන්දේසිවල සම්බන්ධතාවය අරභයා මෙම නඩුව හිතාමතා ම විත්තිකරුට සිරිහැර කිරීමේ ; සිත් වේදනා ගෙනදීමේ , කීර්තිය පළුදු කිරීමේ, අලාභ පැමිණවීමේ සහ අපහාස කිරීමේ අභිලාෂයෙන් ද්වේශ සහගත ලෙස පවරා ඇති බවත්,

විත්තිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

34. ඉහත පූර්වාවයවයෙන්,

(අ) විත්තිකරුට එරෙහිව පවරනු ලැබ ඇති මෙම ගොතන ලද ද්වේශ සහගත නඩුව සඳහා රුපියල් මිලියන පනහක අලාභයක් සඳහාත්,

(ආ) අධිකරණය විසින් ප්‍රදානය කරනු ලබන එම අලාභය පැමිණිලිකාර

...../16

සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කෝර්නල් එල්. පෙරේරා ගෙන් සහ මෙම නඩුව පැවරීමට වගකිව යුතු පැමිණිලිකාර සමාගමේ වෙනත් කවර හෝ අධ්‍යක්ෂවරුන්ගෙන්ද, අයකරවා ගන්නා ලෙසට, පැමිණිලිකාර සමාගමට නියම කෙරෙන නියෝගයක් සඳහාත, පැමිණිලිකාර සමාගමට එරෙහිව නඩු නිමිත්තක් විත්තිකරුට උපචය වී ඇත.

එබැවින් විත්තිකරු අයැද සිටිනුයේ :

(අ) පැමිණිලිකාර සමාගමේ නඩුව නිෂ්ප්‍රභා කරන ලෙසත්,

(ආ) පැමිණිලිකාර සමාගමේ අයිතීන් සහ එහි කොටස් කරුවන්ගේද අයිතීන් ආරක්ෂා කරගනු පිණිස පවරනු ලැබූ කොළඹ දි. උ. අංක 3155/විශේෂ සහ 3231/විශේෂ දරණ නඩුවලින් එළිදරව්වූ අයථා ක්‍රියාවන් පිළිබඳව, වහාම වගවිභාග සහ විමර්ශන පැවැත්වීමට පැමිණිලිකාර සමාගම නීතියෙන් බැඳී සිටින බවට ප්‍රකාශයක් සඳහාත්,

(ඇ) ඉහත (ආ) ආයාචනය යටතෙහි පවත්වනු ලබන වගවිභාග සහ විමර්ශණවල ප්‍රතිඵලයක් වශයෙන්, පැමිණිලිකාර සමාගමේ වරදකාර අධ්‍යක්ෂවරුන්ට වෙනත් කවර පුද්ගලයින්ටද එරෙහිව, නීත්‍යානුකූලව අවශ්‍ය කෙරෙන පරිද්දෙන්, වහාම පියවර ගැනීමට පැමිණිලිකාර සමාගමට නියම කෙරෙන නියෝගයක් සඳහාත්,

(ඈ) ඉහතකී කොළඹ දි.උ. අංක 3155/විශේෂ සහ 3231/විශේෂ දරණ නඩු වලින් එළිදරව් වී ඇති පරිදි, පැමිණිලිකාර සමාගමේ කටයුතු තත්වය පිළිබඳව, එහි සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ කෝර්නල් එල්. පෙරේරා ප්‍රධාන විධායක වශයෙන්, වග කිවයුතු බවට සහ වග කියන ලෙසට සහ ඒ අනුව, ඔහු පැමිණිලිකාර සමාගමේ එවැනි සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ තනතුරක් හෝ අධ්‍යක්ෂ තනතුරක් ඉසිලීමට සුදුසු සහ නිසි පුද්ගලයෙකු නොවන බවටත් ප්‍රකාශයක් සඳහාත්,

(ඉ) මෙම නඩුවෙන් විත්තිකරුට එරෙහිව සාවද්‍ය ලෙසින් කර ඇති ඉල්ලීම පිළිබඳව, පි/ස. කෝර්නල් පෙරේරා සහ සමාගමට එරෙහිව, වහාම ක්‍රියා කිරීමට, පැමිණිලිකාර සමාගම නීතියෙන් බැඳී සිටින බවට ප්‍රකාශයක් සඳහාත්,

(ඊ) මෙම නඩුවෙන් විත්තිකරුට එරෙහිව සාවද්‍ය ලෙස කර ඇති ඉල්ලීම පිළිබඳව, වරලත් ගණකාධිකාර පෝ/ඩී, රෝඩ්ස් තෝන්ටන සහ සමාගමට එරෙහිව වහාම ක්‍රියා කිරීමට, පැමිණිලිකාර සමාගම නීතියෙන් බැඳී සිටින බවට ප්‍රකාශයක් සඳහාත්,

(උ) රුපියල් මිලියන පනහ (රු. 50,000,000/-)ක අලාභයක්, ඒ මත මෙහි දිනයේ සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා නයිතික පොළිය සහ ඉන් අනතුරුව, සම්පූර්ණයෙන් ගෙවන තෙක්, තීන්දු ප්‍රකාශිත මුදල මත නයිතික පොළියත් සහිතව අයකර ගැනීමට පැමිණිලිකාර සමාගමට එරෙහිව නඩු තීන්දුවක් සඳහාත්,

(ඌ) ඊහත (උ) ආයචනය ප්‍රකාර වන එම අලාභ, ඉහතකී පොළිද සහිතව, පැමිණිලිකාර සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ, කෝර්නල් එල්. පෙරේරාගෙන් සහ මෙම නඩුව පැවරීම සඳහා වග කිවයුතු පැමිණිලිකාර සමාගමේ වෙනත් තවර හෝ අධ්‍යක්ෂවරුන්ගෙන් අයකර දෙන ලෙසට පැමිණිලිකාර සමාගමට නියම කරමින් නියෝගයක් සඳහාත්,

(එ) නඩු ගාස්තු සහ

(ඒ) ගරු අධිකරණයට උචිතයැයි හැඟෙන්නාවූ වෙනත් සහ එවැනි යොග්‍ය නියෝගයන්, නියමයන් සහ සහනයන් සඳහාත්ය.

[signature]

විත්තිකරුගේ නීතිඥයින්